

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තු වෙත ඉදිරිපත් කිරීම

நிறுவனத்தின் பெயர் நிருவாக மேன்முறையீடுகள் நியாய சபை பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Administrative Appeals Tribunal submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119 (4).

<u>පාර්ලිමේන්තු අනු අංක 290</u>

<u>ආයතනයේ නම : පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය</u>

රාජ්‍ය ගිණුම් කාරක සභාව හඳුනාගන්නා ලද අඩුපාඩුව	**එම අඩුපාඩුව නිවැරැදි කර ගැනීම සඳහා ගන්නා ලද ක්‍රියා මාර්ග සහ වර්තමාන තත්ත්වය**
පළමු කොටස 72:00	
I. වාර්ෂික මුල්‍ය ප්‍රකාශන නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. II. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට ඉදිරිපත් කර නැත.	නිරීක්ෂණ පිළිගනිමි. ඉදිරියේ දී ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇති අතර 2022 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම නියමිත දිනට පෙර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
III. අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	අභ්‍යාන්තර විගණන නිලධාරියෙකු පත්කර නොමැති හෙයින් අභ්‍යන්තර විගණනයක් සිදු නොවන අතර අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනයක් ද මේ නිසා පවත්වා නැත.
IV. පාරිභෝගික ද්‍රව්‍ය ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	නිරීක්ෂණ හා එකඟ නොවෙමි. ලිපිද්‍රව්‍ය තොග පොත යාවත්කාලීනව පවත්වා ඇත.
V. 2004.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව මෘදුකාංගයට අදාල පළමු, දෙවන හා තෙවන මුර පද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	2021 වර්ෂයේ දී මෙම අධිකාරයේ ගණකාධිකාරිවරයෙකු වැඩ බැලීමේ පදනම මත හෝ පත්කර නොතිබුණි. එහෙත් ලිපිකරු නිලධාරීන් දෙදෙනෙකුගෙන් එම කටයුතු සිදු කළ අතර මුරපදය වරින්වර වෙනස් කර තිබුණි. 2023 වර්ෂයේ ගණකාධිකාරිවරයෙකු වැඩ බැලීම සඳහා පත් කිරීමෙන් පසු චක්‍රලේඛයේ උපදෙස් පරිදි මාස තුනකට වරක් මුරපදය වෙනස් කිරීමට කටයුතු කර ඇත.

VI.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	2021 වර්ෂයේදී රටතුළ උද්ගතව පැවති කොවිඩ් 19 රෝග ව්‍යාප්තිය හමුවේ කාර්යාල කටයුතු අඩාලව පැවතීම නිසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම කළ නොහැකිව තිබුණි. කෙසේ වෙතත් 2022, 2023 වර්ෂවල අදාල ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.
VII.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.	අධිකාරයේ සැපයුම් සඳහා මිලදී ගැනීම් සිදු කරනුයේ වරින්වර ලිපිද්‍රව්‍ය ඉතා සුළු ප්‍රමාණයන්ගෙනි. එයද වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙතිනි. එබැවින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියල කිරීම ප්‍රායෝගික නොවන අතර 2024 වර්ෂය සඳහා ද ලිපිද්‍රව්‍ය සඳහා වෙන්කර ඇත්තේ රු. 800,000/- ක් පමණි.
VIII.	සියලුම වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි .	අධිකාරය සතුව ඇත්තේ වාහන දෙකක් පමණක් වන අතර එකක් සභාපතිතුමා සඳහා වෙන්කල වාහනයකි. අනෙක් වාහනයේ රාජ්‍ය ලාංඡනය යෙදීමට කටයුතු යොදා ඇත.
IX.	2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවක් කර නොතිබුණි.	නිරීක්ෂණ හා එකඟ වෙමි. 2024 වර්ෂයේදී ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂා කිරීමට කටයුතු යොදා ඇත.
X.	මු.රෙ. 04 (1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කල පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළැඹ තිබුණේය.	නිරීක්ෂණ හා එකඟ නොවෙමි. එසේ බැරකම්වලට එළැඹ නොතිබුණි.
XI.	නියමිත කාලයෙන් බැහැරව ප්‍රතිපාදන වෙනත් ආයතන වෙත වෙන්කරඇත.	නිරීක්ෂණ මෙම ආයතනයට අදාල නොවේ.

XII.	2019.09.20 දිනැති අංක 04/2017 දරන කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි.	නිරීක්ෂණ හා එකඟ නොවෙමි. සෑම කාර්තුවක් අවසානයේ අදාල තොරතුරු යවා ඇත.
XIII.	මු.රෙ. 134 (2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේ දී පිළියෙල කර නොතිබුණි.	අභ්‍යන්තර විගණකවරයෙකු නොමැති නිසා මෙපරිදි කටයුතු කිරීමේ හැකියාවක් නැත.
XIV.	විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2 ක් වත් පවත්වා නොතිබුණි.	නිරීක්ෂණ මෙම ආයතනයට අදාල නොවේ.

I. ආයතනය පිළිබඳ මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මානය කර පවත්වාගෙන ගොස් නොතිබුණි.	වෙබ් අඩවියක් සකස් කිරීමට මූලික කටයුතු සිදුකර තිබුණ ද මහ භාණ්ඩාගාරයෙන් ඒ සඳහා මුදල් වෙන්කර දීමක් සිදුකර නොතිබුණි. 2024 වර්ෂය සඳහා මෘදුකාංග සංවර්ධනය යටතේ රුපියල් මිලියන 7.2 ක් වෙන්කර ඇති අතර මෙම වර්ෂයේ දි එම කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත.
II. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මඟින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ඉහත නිරීක්ෂණය නිසා මෙහි සඳහන් කරුණ මෙම අධිකාරයට අදාල නොවේ.
III. 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	ආයතනයේ කාර්ය මණ්ඩලය 18 ක් වීමත් එවකට පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ කාර්යාල කටයුතු අඩපණවීමත් හේතුවෙන් නිලධාරීන් පුහුණු කිරීම් කටයුතුවලට යොමු කිරීමේ හැකියාවක් නොතිබුණු බැවින් එවැනි සැලැස්මක් පිළියල කිරිම ප්‍රායෝගික නොවේ.
IV. සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මඟින් කාර්ය මණ්ඩලයෙන් 50% ට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථා සහතික කර නොතිබිණි. සමස්ථ කාර්ය මණ්ඩලයම ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස්කර ගිවිසුම්ගතව නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම නිසා මෙම නිරීක්ෂණ අදාල නොවේ.

V.	මානව සම්පත් සංවර්ධන සැලසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර නොතිබුණි.	මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබීම නිසා මෙම නිරීක්ෂණ අදාල නොවේ.
VI.	ආයතනය තම විෂය පථය අනුව තිරසාර අරමුණු හඳුනාගෙන නොතිබුණි.	අධිකරණ ක්‍රියාදාමයක් මෙම අධිකාරයේ ක්‍රියාත්මක වන අතර, තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හෝ ක්‍රියාත්මක කිරීම මේ නිසා කළ නොහැකිව ඇත.
VII.	හඳුනාගත් තිරසාර අරමුණු ඉලක්ක ළඟා කර ගැනීම මැන බැලීම සඳහා කාර්ය සාධන ඉලක්ක නියම කර නොතිබුණි. හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි.	අධිකරණ ක්‍රියාදාමයක් මෙම අධිකාරයේ ක්‍රියාත්මක වන අතර, තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හෝ ක්‍රියාත්මක කිරීම මේ නිසා කළ නොහැකිව ඇත. අධිකරණ ක්‍රියාදාමයක් මෙම අධිකාරයේ ක්‍රියාත්මක වන අතර, තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීම හෝ ක්‍රියාත්මක කිරීම මේ නිසා කළ නොහැකිව ඇත.
VIII.	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතුණි.	ඉහත කරුණ නිසා නිරීක්ෂණ අදාල නොවේ.
IX.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	නිරීක්ෂණ හා එකඟ නොවෙමි. විගණකාධිපතිගේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත.
X.	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිනුම් කල හැකි කාර්ය සාධන දර්ශක 03 ක් හඳුනාගෙන නොතිබුණි.	නිරීක්ෂණ මෙම අධිකාරයට අදාල නොවේ.

XI.	සියලු නිලධාරීන් වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂිකව වත්කම් බැරකම් ප්‍රකාශ කළ යුතු මට්ටමේ මාණ්ඩලික නිලධාරීන් මෙම අධිකාරයේ නොමැත.
XII.	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරුකර යැවීමට කටයුතු කර නොතිබුණි.	මෙම අධිකාරය විශේෂිත වූ පනතක් යටතේ පිහිටුවන ලද්දක් වන අතර මෙම නිරීක්ෂණ අදාල නොවේ.

